දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449, 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපැලල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) FHB/AH/GEN/2016
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 09 /11/2016
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

පොදු චක්‍රලේඛ අංකය 01 - 63 /2016

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු
සියලුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
සියලුම අධ්‍යක්ෂවරු/ වෛද්‍ය අධිකාරිවරු /සෞඛ්‍ය ආයතනභාර නිලධාරීන්,
සියලුම විශේෂ වැඩසටහන් භාර අධ්‍යක්ෂවරු,
ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ,
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, කොළඹ මහ නගර සභාව,
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්,

## ළමා සෞඛ්‍ය සේවාව සපයන වයස් සීමාව අවුරුදු 14 දක්වා ඉහළ දැමීම

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අවුරුදු 10 සිට 19 දක්වා කාලය නව යොවුන් විය ලෙස අර්ථ දක්වයි. ළමා කාලය අවසන්ව වැඩිහිටි වියට පත් වීමට පෙර එළඹෙන මෙම කාලය තුලදී ඔවුන් තුල වේගවත් වර්ධනයක් සහ සංවර්ධනයක් සිදුවේ.

මෙම අවධියේදී සිදුවන සුවිශේෂී ජීව විද්‍යාත්මක සහ මනෝ සමාජීය වෙනස්වීම් නිසා නව යොවුන් වියේ දරුවන් අතර විවිධ ගවේෂණ සහ අත්හදා බැලීම් වලට යොමු වීමක් දක්නට ලැබේ. මෙම නව යොවුන් වියේ බොහෝ දරුවන් නිරෝගී අය ලෙස පෙනුනද, ඔවුන් අවධානම් සාධක හේතුවෙන් ලෙඩ රෝග වලට හා මරණයට පවා භාජනය වීම සිදුවේ. ඕනෑම වයසක පුද්ගලයෙකු, තම වයසට සහ සංවර්ධනයට යෝග්‍ය සෞඛ්‍ය සංරක්ෂණයක් ලබා ගැනීම තුලින් ප්‍රශස්ථ සෞඛ්‍ය සේවාවක් සපුරා ගනී. නව යොවුන් සහ යොවුන් දරුවන්ගේ ජීවිත කාලය පුරා ක්‍රියාකරන යහ පැවැත්ම සඳහා සැලසුම් කරන ලද සෞඛ්‍ය සේවා පරිවර්තනය ඉතා වැදගත්වේ.

ළමා වියේ සිට වැඩිහිටි විය දක්වා පිය නැගීමේදී ගුණාත්මක බවින් ඉහළ වර්ධනයට අනුකූල, අඛණ්ඩ සෞඛ්‍ය සේවාවක් ලබා දීම සහතික කිරීම මෙම පරිවර්තන ක්‍රියාවලියට ඇතුලත් වන අතර මෙම පරිවර්තනය කාලානුරූපව සිදු කිරීම ඉතා වැදගත්වේ.

ළමා වියේ සිට වැඩිහිටි විය දක්වා සෞඛ්‍ය සත්කාර සැපයීමේ සංක්‍රාන්ත්‍රික වයස බොහෝ සංවර්ධිත රටවල අවුරුදු 14-18 දක්වා වෙනස්වේ. පොත් පත් වල සඳහන් වන පරිදි සේවා පරිවර්තනයට සුදුසුම වයස වන්නේ ඔවුන්ගේ වර්ධනය හා සංවර්ධනය අවසන් වූ පසුවයි. එයට හේතුව වන්නේ වැඩිහිටියන් සඳහා වන සෞඛ්‍ය සේවාවේදී නව යොවුන් දරුවන්ගේ වර්ධනය හා සංවර්ධනය කෙරෙහි අවශ්‍ය තරම් අවධානයක් යොමු නොවීමයි. සීඝ්‍ර කායික වර්ධනය සහ සංවර්ධනය අවුරුදු 17 වන විට සම්පූර්ණ වුවද, මොළයේ ප්‍රශස්ථ පරිණතවීම සිදුවන විට අවුරුදු විසි පහ පමණ වේ. මෙම පරිවර්තන සමයේදී නව යෞවනයන්ට වැඩිහිටියන් ලෙස ක්‍රියා කරීමට හැකි විය යුතු අතර ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය කුසලතා තිබිය යුතුය. එමෙන්ම ඔවුන්ගේ ලෙඩ රෝග, දෙමව්පියන්ගේ සහ කාර්ය මණ්ඩලයේ උදව් නොමැතිව ඔවුන්ට කළමණාකරනය කර ගත හැකි විය යුතුය.

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය අනුව ළමා සෞඛ්‍ය සේවාව සපයන වයස් සීමාව අවුරුදු 12 වේ. අවුරුදු 12 අවසන් වූ වහාම මෙම දරුවන්ට වැඩිහිටි සායන වලදී හෝ වාට්ටු වලදී ප්‍රතිකාර

කිරීමේදී, ඔවුන් අපහසුතා වලට ලක්වේ. එයට හේතුව ඔවුන් ශාරීරිකව මෙන්ම මානසිකවද වැඩිහිටියෙක් ලෙස ප්‍රතිකාර සඳහා තවම සූදානමක් නොමැති වීමයි. එසේම මුල් නව යොවුන් විය වන අවුරුදු 10 සිට 14 දක්වා ඔවුන් තුල යෞවනෝදයේදී සිදුවන වෙනස් වීම් සිදු වුවද, ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ගැටළු ඇතිවන්නේ නව යොවුන් වියේ මැද හෝ අවසන් භාගය වන අවුරුදු 15 ත් 19 ත් අතර කාලයේදීය.

විද්‍යාත්මක පදනම හා කාලීන අවශ්‍යතාවය සැලකීමෙන් සහ ප්‍රවර්ධන හැකියාව අධ්‍යයනය කිරීමෙන්, ළමා සෞඛ්‍ය සේවාව සපයන වයස් සීමාව අවුරුදු 14 දක්වා ඉහළ දැමීමට නිර්දේශ විය. මෙය මාස 6 ක් දක්වා ක්‍රියාත්මක කර, එයට අදාල පාර්ශ්වයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර අනුව ළමා සෞඛ්‍ය සේවාව සපයන වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කිරීමේ හැකියාව පිළිබඳ සලකා බලනු ඇත. ළමා සෞඛ්‍ය සේවා සපයන වයස් සීමාව අවුරුදු 14 අක්වා ඉහළ දැමීම 2016.11.01 දින සිට ක්‍රියාත්මක වේ. නව යොවුන් දරුවන් සඳහා මෙම වයස් සීමාව අනුව සේවා සැපයීමට අවශ්‍ය කටයුතු සලස්වන මෙන් මෙයින් උපදෙස් දෙමි.

ඉහත සඳහන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට ස්වකීය වපසරිය තුල අවශ්‍ය කටයුතු සලසන ලෙස, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගෙන්ද, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගෙන්ද, ආයතන ප්‍රධානීන්ගෙන්ද ඉල්ලා සිටිමි.

වෛද්‍ය ... පාල
සෞඛ්‍ය ... ජනරාල්
සෞඛ්‍ය පෝෂණ ... වෛද්‍ය අමාත්‍යාං...
385, ... වංශ හිමි මාවත,

..............................................................

වෛද්‍ය පී ජී. මහිපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
ලේකම්/සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

අතිරේක ලේකම්/ වෛද්‍ය සේවා/ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

අතිරේක ලේකම්/ මහජන සෞඛ්‍ය සේවා/ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/ I සහ II/ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් /වෛද්‍ය සේවා / සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/ සැලසුම් / සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ/ සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/ රසායනාගාර සේවා / සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සියලුම විද්වත් වෘත්තියමය සංගම් වල සභාපතිවරු

ශ්‍රී ලංකා නියෝජිත, ලෝක සෞඛ්‍ය සංවිධානය/ එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල/ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල/ලෝක බැංකුව/ ලෝක ආහාර වැඩසටහන